# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා වන ආරාධනය (EOI)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## ප්‍රසම්පාදන ආයතනය - පරන්තන් කෙමිකල්ස් සමාගම

## (Paranthan Chemicals Company Limited)

**ශ්‍රී ලංකාවේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන්හි ස්ථාපිත කිරීමට යෝජිත කෝස්ටික් සෝඩා / දියර ක්ලෝරීන් ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති උපදේශක ආයතනයක් තෝරා ගැනීමට අදාළව අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI)**

**ගොනු අංකය: PCCL/CPCM/CFSP/CSF/CHLO/2025/02**

පරන්තන්හි වෙන් කරන ලද අක්කර 30 ක භූමි ප්‍රමාණයක, ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස ලුණු භාවිතා කරමින් දිනකට මෙට්‍රික් ටොන් 30 ක ධාරිතාවයකින් යුත් නව කෝස්ටික් සෝඩා – ක්ලෝරීන් කම්හලක් පිහිටුවීමට පරන්තන් කෙමිකල්ස් සමාගම සැලසුම් කර ඇත. කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන් වලට අමතරව, මෙම මධ්‍යස්ථානය මගින් පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් (PAC), හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (HCl) සහ සෝඩියම් හයිපොක්ලෝරයිට් (NaOCl) අගය එකතු කළ අතුරු නිෂ්පාදන ලෙස නිෂ්පාදනය කරනු ඇත.

1. පරන්තන් කෙමිකල්ස් සමාගම වෙනුවෙන් අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා, මෙහි සඳහන් සේවාවන් සැපයීම සඳහා සුදුසුකම් ලත් දේශීය හෝ විදේශීය උපදේශක ආයතන වෙත තම අභිලාෂය ප්‍රකාශ කරන ලෙස ආරාධනා කරයි. උනන්දුවක් දක්වන උපදේශකයින් විසින් සේවාව ඉටු කිරීමට තමන් සතු සුදුසුකම් සනාථ කරන තොරතුරු (විස්තර පත්‍රිකා, සමාන පැවරුම් පිළිබඳ විස්තර, සමාන තත්ත්වයන් යටතේ පළපුරුද්ද කාර්ය මණ්ඩලය සතු කුසලතා ආදිය) ඉදිරිපත් කළ යුතුය. (ලේඛන ඉදිරිපත් කළ යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.)

2. ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද උපදේශකයින් තෝරා ගැනීම සහ බඳවා ගැනීම පිළිබඳ මාර්ගෝපදේශ (2007) 3.6 වගන්තියට අනුව, QCBS (ගුණාත්මකභාවය සහ පිරිවැය මත පදනම් වූ තෝරාගැනීම) ක්‍රමය යටතේ උපදේශක ආයතනයක් තෝරා ගනු ලැබේ.

3. උනන්දුවක් දක්වන උපදේශකයින්ට පහත ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැක: සභාපති, පරන්තන් කෙමිකල්ස් සමාගම, L-4, අංක 446, ගාලු පාර, රත්මලාන – ශ්‍රී ලංකාව. දුරකථන: +94112437830 / +94773043368 / +94704120503 විද්‍යුත් තැපෑල: **chairman@pccl.lk**

4. අභිලාෂය ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වන ආයතන, යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා පහත වෙබ් අඩවි වල ඇති ව්‍යාපෘති සාරාංශ ලේඛනය (Project Summary Document) හොඳින් අධ්‍යයනය කරන ලෙස උපදෙස් දෙනු ලැබේ: **https://pccl.lk**, **https://promise.lk/**, **https://www.industry.gov.lk**/

5. අභිලාෂය ප්‍රකාශ කිරීමේ අයදුම්පත් 2026 ජනවාරි 19වන දින1400පැයට පෙර පහත ලිපිනයට භාර දිය යුතුය: සභාපති, අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, අංක 73/1, ගාලු පාර, කොළඹ 03 – ශ්‍රී ලංකාව. දුරකථන: 0112433 725 / 071821 7194 විද්‍යුත් තැපෑල: **adsec-policy@industry.gov.lk/** වෙබ් අඩවිය: **https://www.industry.gov.lk/**

**සභාපති,**
**අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව,**
**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය.**